සන්නස
SANNASA



# සැබෑ වෙනසකට කාලය පැමිණ ඇත



වර්නන් තිසේරා
ඕස්ට්‍රේලියා.

**මේ ලිපිය බලන එක්සත් ජාතික පක්ෂෙ ශ්‍රී ලංකා නිදහස් පක්ෂෙ අයයි අනිකුත් දේශපාලන පක්ෂ වල අයයි මගේ අදහස් වලට විරුද්ධ වෙන්න පුළුවන් නමුත් මෙය සැබෑ සත්‍යයි. ඒ වාගේම සැබෑ වෙනසකට කාලය පැමිණ ඇත. එය පළමුව තනතුරු බලය. ජාති, ආගම් පසෙකට දමා " නව එක්සත් ශ්‍රී ලංකාවක්" බිහි කිරීමට ඒකරාශි විය යුතුය.**

ඉන්දියන් සාගරයේ මැද මුතු ඇටයක් වූ ශ්‍රී ලංකාව

සාගරයක් මැද අමන රටක් කලේ අපේම දේශපාලකයෝ විසිනි.

මොහුන්ගේ මේ පටු වාසි බල තන්හාව නිස ාම රටත් ජාතියත්, අදහන ආගම්ද විනාශ විය. විනාශ වෙමින් පවති. එය අද මෙන්ම හෙට දවස තුලද නොවහලා වෙනබව සක්සුදක් සේ පැහැදිලිය.

ගෞතම බුදුන් දෙසු වදනින් ඔපවත් වී ලොව බුදුදහමේ මුදුන් මල්කඩක් සේ සැලකු රටේ, පිරිත් නූල් හැටහුටමාරක් බැඳගෙන, තම බලය උදෙසා දේශපාලකයෝ යන විෂම සර්පයා රටත් ජනතාවත් උපරිමය පීඩාවකට පත් කර ඇති බව ඉතාමත් විනිවිදව අපූර්ව අද දැකිය හැකිය.

ශ්‍රී ලංකාවට බිහිවූ එකම මහාත්මා දේශපාලන නායකයා ඩඩ්ලි සේනානායකය. ජනතාවට රිදවන්න අකමැති වූ තැන අගමැති තනතුරෙන්, ඊළඟට නායකත්වය යන් පවා ඉල්ලා අස්වූ මෙතුමා මියයනවිට රුපියල් 300 ක සුළු මුදලක් බැංකු ගිණුමක තිබුනු බව එකල මුළු රටම දනී. ඒවගේ ඇහෙන කොට දැන් ඉන්න දේශපාලක හොරුන් ගැන කවර කතාද.

1970 සිරිමවෝ බණ්ඩාරනායක සමගි පෙරමුණ රජය රට විනාශකාරි දේශපාලන ක්‍රමය ඇරඹූ අතර 70 77 දුර්දන්ත පාලනය ඒකාධිපතියෙක් නිර්මාණය කිරීමට ආරම්භක වෙඩිමුරය තැබූ අතරම උතුරේ 30 වසරක ශාපකාරී යුද්ධයේ ඇරඹුමත් මේ වකවානුව තුළ ඇති වූ බව අපට මතකය. වර්තමාන හිටපු ජනාධිපති අගමැති සහ ඇමති වරු කීපදෙනෙක් ද සිටි එදා රජයේ සිදු වූ අක්‍රමිතා දහස් ගණනක් අතර ශ්‍රාවස්තියේ සහ තානායම් වල පත්වීම් දෙනබව කියමින් මන්ත්‍රී/ ඇමති වරුන් විසින් කළ ගැහැණු දූෂණ, මන්ත්‍රී/ ඇමති ලියුම්වලට රැකියා දීම, හාල් මිරිස් පොලු දැමීම, මන්ත්‍රී/ ඇමති/අගමැති පවුල් වල අයට පිටරට කෑම (එක් ඇමතියෙක් ගේ කුකුළු පාම් එකේ කුකුලන්ට පිටරට පිටි කිරි දී ඇත) රටේ සාමාන්‍ය වැසියාට මයියොක්කා, බතල, ගස්ලබු සහ සිකුරාද බත් කෑම තහනම් කිරිම, මාධ්‍ය නිදහසට අගුල් තබමින් ලේක්හවුස් රජයේ පාලනයට ගැනීම පත්තර සීල් තැබීම (දවස නිවස) විරුද්ධ පක්ෂයට උපරිම හානි කිරීම, පස් වසරක පාලන කාලය බලයෙන් වංචාවෙන් අවුරුදු 7 ක් දක්වා පාලනය කිරීම.

ඉහත දැක්වූ කරුණු මුල් කරගෙන මේ සියළු දේත්, දේශපාලන අඩතේට්ටම් වලින් තෙම්පරාදු වී සිටි ජේ.ආර්. ජයවර්ධන, නමැති අතිමහත් උගත් මෙන්ම සටකපට දේශ පාලකයා 1977 මහා මැතිවරණයෙන් විශිෂ්ඨ ජයක් ලබන්නේ සිරිමාවෝ බණ් ඩාරනායක සමඟි පෙරමුණ ආසන හත අටකට සීමා කරමින්. ඉන් අනතුරුව (මහින්ද, ඩී.ඇම් ජයරත්නලා හිරේ සිටිබ වත් අප අසා ඇත.) උපරිම දේශපාලන පළිගනිමින්, රට පාලනය කළ අතර ජේ.ආර්. නායකත්වයේ ආධිපත්‍ය උපරිමය ඇති නායකයා වශයෙන් පත්වී ඊට ටික කාලයකට පසු අද බුමරංගයක් සේ එක්සත් ජාතික පක්ෂයටම කොකා පෙන්වන අසමසම බලය සහිත ජේ.ආර්. ගේ වචන වලින් කියනවනම් "ගැහනියක් මිනිහෙක් කිරීමටත්, මිනිහෙක් ගැහැනියක් කිරිමටත් පමණක් බැරි වූ" වූ විධායක බලතල සහිත ජේ. ආර් (සමයේ) "අති ගරු උතුමාණන්" නමින් හඳුන්වා දුන් ලොව කිසිම රාජ්‍ය නායකයෙකුට නොමැති මෙම ඒකාධිපති බලය සහ ජේ.ආර්. හදපු කැඳ සහ සුප් හැලිය නමින් ප්‍රචලිත මනාප චන්ද ක්‍රමය අප රට ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කරන ලදී. කරමින් පවති. ධර්මිෂ්ට සමාජයක් කියා නම් කර මිනිස් ජීවිත ටයර් සෑයවල සිට සුදු වෑන් දක්වා අමානුෂිකව සිය දූෂිත පැවත්ම වෙනුවෙන් විනාස කරන ලදි. කරමින් පවති.

මෙම විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරමින් නව ව්‍යවස්ථාවක් හදා ගැනීමට සඳහා දැන් කාලය පැමිණ ඇත.

මා විසින් අදහස් දක්වන කරුණු අනුව යම්කිසි නව පාලන ක්‍රමයක් ඇති කරගැනීම තුලින් මුළු මහත් රටටම යහ පාලනයක්, ජාති වාදි, ආගම් වාදී ඒකාදිපති පාලනයෙන් තොරව මුළු මහත් රටටම සෞභාග්‍යය උදාවනු නියතය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ, මුස්ලිම් / දෙමළ ඇතුළු අනිකුත් දේශපාලන පක්ෂ සියළු දෙනා ම අවංකව රට ගැන පළමුව සිතා මේ තීරණය ගත යුතුය.

මේ සැම දේශපාලන පක්ෂයකම ඉතා දක්ෂ රට වෙනුවෙන් වැඩ කරන්න පුළුවන් විශාල පිරිසක් ඇත. ඔහුන්ගේ සේවය රටට අවශ්‍යයි.

විශාල වශයෙන් කුහක වර්තමාන දේශපාලක නූගත් හොරුන් මෙයට අකමැති වුනත් සෑම දේශපාලනයෙක්ම තමා සහ තම බඩේ යහපත වෙනුවෙන් ඒකරාශි වියයුතු කාලය පැමිණෙ ඇත.

පළමුව දැනට අපරට රාජතන්ත්‍රව හඳුන්වන නම වෙනස් විය යුතුය. එනම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවට

"එක්සත් ශ්‍රී ලංකා ජන රජය"

ඒකාධිපති විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කර

නාම මාත්‍රික ජනාධිපති වරයෙක් රටේ අගමැති සහ විපක්ෂ නායක නම් යෝජනා කර රටේ වැදගත් උගත් දේශපාලන පසුබිමක් නොමැති පුද්ගලයෙක් පත් කිරීම සහ අපේ මුලින්ම හිටපු පළමු ජනාධිපති විලියම් ගොප්පලව මහතා මෙන් කටයුතු කළ යුතුය.

රටේ රාජ්‍ය නායකයා අගමැති වේ.

පවතින එකම පක්ෂයේ අය මරාගන්න, වෛරය, දූෂණය ඉහවහා ගිය මනාප ක්‍රමය නමැති විෂම ඡන්ද ක්‍රමය සුන්නත් දූවිලි කර දමා සැබෑ ප්‍රජාතන්ත්‍රිවාදී ආසන මට්ටමෙන් පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීම

- සියලුම පළාත් සභා සහ අමාත්‍යාංශය විසුරුවා හැරදැමීම සහ සුදු අලියෙක් වශයෙන් රටේ අති මහත් ධනස්කන්ධයක් විනාස කරන මෙම ක්‍රමය වෙනුවට මා විසින් යෝජිත නව ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

පාර්ලිමේන්තුවට වගකියන බලය සහිත අග්‍රමාත්‍ය වරයෙක් සහ කැබිනට් ඇමති මන් ඩලයක් එය 15 ක් ගෙන් සහ පළාත් සභා මහා ඇමති වරු 9 දෙනා ගෙන් සමන්විත වේ.

1. අගමැති සහ රාජ්‍ය ආරක්ෂක ඇමති
2. මුදල් සහ ක්‍රම සම්පාදන ඇමති
3. අධ්‍යපන ඇමති
4. සෞඛ්‍ය ඇමති
5. කෘෂිකර්ම සහ ඉඩම් සහ ඉඩම් සං වර්ධන
6. සංස්කෘතික සහ කලා කටයුතු සහ ජනමාධ්‍ය ඇමති.
7. ක්‍රීඩා සහ තරුණ කටයුතු ඇමති
8. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු ඇමති
9. අධිකරණ ඇමති
10. කාන්තා කටයුතු සහ ළමා සංවර්ධන ඇමති.
11. රැකියා සහ කම්කරු කටයුතු පිළිබඳ ඇමති
12. විද්‍යා සහ තාක්ෂණය කටයුතු ඇමති
13. විදේශ ආගමන විගමන කටයුතු ඇමති
14. ගුවන් වරාය හා මහාමාර්ග ඇමති
15. කර්මාන්ත හා වාණිජ කටයුතු ඇමති

අගමැතිගේ නායකත්වය මෙම කැබිනට් ඇමතිවරු 15 දෙනා සමඟ එකට පළාත් සභා මහා ඇමතිවරු 9 දෙනා පාර්ලි මේන්තුවේ අසුන් ගන්නා අතර කැබිනට් හමුව තීරණ එකට කටයුතු කල යුතුය. මෙහි මූලික අරමුණ එක්සත් ශ්‍රී ලංකාව සඳහාය, මුළු රටටමය. මේ මඟින් පළාත් සභා මහ ඇමතිවරු නව දෙනා ද පාර්ලි මේන්තුවේ සහ කැබිනට් මණ්ඩලයේ සිට ඒ ඒ පළාත් සභා පාලනය, සංවර්ධනයට කෙලින්ම සම්බන්ධ වේ. මෙහි දී දැනට සිටින ඒ ඒ පළාත් සභා ආණ්ඩුකාර වරු පත් කිරීමක්ද අවශ්‍ය වන්නේ නැත (ඒ මගින්ද විශාල ධනයක් විනාස වීම වැලකේ)

ඇත්තටම සඳහන් කලොත් මේ කලාන්තරය ක් තිස්සේ කකුල්වලින් ඇදගෙන දඟලන 13 වන ව්‍යවස්ථා සංශෝදනය පසෙකට දමා සිංහල, දෙමළ, මුස්ලිම් සියළු දෙනාගේම අයිතිවාසිකම් සුරැකෙන පාලනය ක් මේ තුලින් අනිවාර්යෙන්ම ඇති වේ. මිලයන ගණන් වැය කරමින් මහජන මුදල් කබාසීනියා කරන සුදු අලියෙක් වූ පළාත් සභා ආණ්ඩුකාරවරු, මැති ඇමති, මන්ත්‍රී නිළධාරීන් නඩත්තුවට නැවතීමේ ලකුණ දමා ඒ මහා ධනස්කන්ධය මුළු රට පුරා සං වර්ධනයට සෑම අයුරකින්ම යෙදිය හැක.

සෑම වසර තුනකට වරක්ම පාර්ලිමේන්තු මහා මැතිවරණයක් පැවැත් විය යුතු අතර පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් අස්වූ හොත් / මියගියහොත් ධූරයෙන් පහකළහොත් අතුරු මැතිවරණයක් පැවතිය යුතුය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනට පක්ෂ මාරු කල හැකිවන්නේ පක්ෂයෙන් සහ මන්ත්‍රී ධූරයෙන් ඉල්ලා අස්වී තමා තෝරාගත් පක්ෂයෙන් සාමජිකත්වය ලැබ හෝ ස්වාධිනව අතුරු මැතිවරණයකින් ජය ලබා ගැනීම තුළිනි.

- රටේ විපක්ෂය
  වැඩි ආසන නොලබන පක්ෂය විප ක්ෂය වන අතර විපක්ෂ නායකයා

26 වන පිටට